ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha ගම්පහ අධ්‍යාපන කලාපය Ga

**ගම්පහ අධ්‍යාපන කලාපය**

**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**

**Second Term Evaluation - 2025**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: **13** | විෂයය Subject: **ඉන්දිය ඉතිහාසය - 1** | කාලය Time: **පැය 03** |

නම/NAME:-........................................................................................................

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල,දී ඇති (1),(2),(3),(4) ,(5)යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරා ගන්න.

---

අංක 1 සිට 10 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත.ඒවා අතුරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැලපේ.එම නොගැලපෙන නාමය කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන් තුළ ලියන්න.

1) 1.සුප්පාරක 2. හාරුකච්ඡ 3. පාටලීපුත්‍ර
4.තාම්‍රලිප්ති 5.කල්යාන් (…….)

2) 1.මහානදී 2.ගෝදාවරී 3.කෘෂ්ණා
4.තුංගභද්‍රා 5.කතියවාර් (……)

3) 1.මෞරිය 2.සූරසේන 3.අවන්ති
4.අංග 5.පංචාල (…….)

4) 1.හින්දුකූෂ් 2.සුලෙයිමාන් 3.හිමාලය
4.තප්ති 5.සත්පුර (…….)

5) 1.ඉන්ද්‍ර 2.මිත්‍ර 3.රාම
4.වරුණ 5.අග්නි (…….)

6) 1.සට්ලෙජ් 2.බියස් 3.බ්‍රහ්මපුත්‍ර
4.රාවි 5.චේනාබ් (…….)

7) 1.ඒ.එල්.බෂාම් 2.ස්ටුවට් පිගොට් 3.ජෝන්මාෂල්
4. ආර්.ඩී.බැනර්ජි 5.මෝර්ටිමර් විලර් (……)

8) 1.කලිබන්ගන් 2.රාමේෂ්වරම් 3.ලෝතාල්
4.මොහොන්ජෝදාරෝ 5.චන්හුදාරෝ (……)

9) 1.මත්ස්‍ය පුරාණ 2. විෂ්ණු පුරාණ 3.වායු පුරාණ
4.පෙරිය පුරාණම් 5.ස්කන්ධ පුරාණ (……)

10) 1.පරමාර 2.ඔස්ට්‍රොලොයිඩ් 3.මධ්‍යධරණී
4. මොංගොලොයි 5.ඇල්ෆයින් (……)

අංක 11 සිට 15 දක්වා යුගල පහ බැගින් දී ඇත.ඒවා අතුරින් එක් යුගලයක පද එකිනෙක හා නොගැලපේ.එම නොගැලපෙන පද යුගලය කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන් තුළ ලියන්න.

11) 1.ගංගා - කනෞජ්
2.නර්මදා - හාරුකච්ඡ
3.තප්ති - සුප්පාරක
4.යමුනා - මථුරා
5.රාවි - හරප්පා (……)

12) 1.අයිහෝලේ - පුලකේෂින්
2.ජුනාගාර්ඩ් - රුද්‍රදාමන්
3.භිටාරි - ස්කන්ධගුප්ත
4.නාසික් - ගෞතමීපුත්‍ර සාතකර්ණී
5.හතිගුම්පා - ඛාරවේල (…….)

13) 1.අංග - චම්පා
2.කාසි - බාරානසී
3.වජ්ජී - වෛශාලි
4.ගන්ධාර - තක්ෂිලා
5.කුරු - පංචාල (…….)

14) 1.දූත - පණිවිඩකරු
2.සංග්‍රහිතෘ - භාණ්ඩාගාරික
3.සූත - රියදුරා
4.සේනානි - සෙම්පතියා
5.භාගදූග - ආරක්ෂකයා (…….)

15) 1.සින්දු ගග - මොහොන්ජෝදාරෝ
2.නර්මදා ගඟ - දේවගිරිය
3.යමුනා ගග - ඉන්ද්‍රප්‍රස්ථ
4.රාවි ගග - හරප්පා
5.ගංගානම් ගග - පාටලිපුත්‍ර (……)

අංක 16 – 20 දක්වා X හා Y තීරුවල දක්වා ඇති තොරතුරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර ඇතුළත් අංකය තෝරා වරහන තුළ ලියන්න.

| | X | Y |
|---|---|---|
| 16) | 1.අල්බිරූනි | A අරාබි |
| | 2.ෆාහියන් | B ග්‍රීක |
| | 3.ප්ලිනි | C චීන |
| | 4.ස්ට්‍රාබෝ | D රෝම |
| | 5.තාරනාත් | E ටිබෙට් |

1.ACDBE 2.ADCEB 3.BACED 4.BDCAE 5.CABED (…….)

| | X | Y |
|---|---|---|
| 17) | 1.අග්නි | A පෘථිවියට අධිපති දෙවියා |
| | 2.ඉන්ද්‍ර | B යුද්ධයට අධිපති දෙවියා |
| | 3.පෘථිවි | C ගින්නට අධිපති දෙවියා |
| | 4.පශුපති | D අහසට අධිපති දෙවියා |
| | 5.වරුණ | E සතුන්ට අධිපති දෙවියා |

1.ACDBE 2.BDCAE 3.CBAED 4.DACEB 5.EDCAB (……)

| | X | Y |
|---|---|---|
| 18) | 1.දන්ඩින් | A මත්තවිලාස ප්‍රහසන |
| | 2.මහේන්ද්‍රවර්මන් | B කතාසරිත්සාගර |
| | 3.සෝමදේව | C දශකුමාරචරිත |
| | 4.කල්හන | D නාගානන්ද |
| | 5.හර්ෂවර්ධන | E රාජතරංගිනි |

1.ACDBE 2.BDCAE 3.CABED 4. CBAED 5.DCEBA (…….)

| | X | Y |
|---|---|---|
| 19) | 1.ඉන්ද්‍රප්‍රස්ථ | A යමුනා |
| | 2.භාරුකච්ඡ | B ගංගා |
| | 3.රූපාර් | C සත්ලේජ් |
| | 4.කනෞජ් | D නර්මදා |
| | 5.හරප්පා | E රාවි |

1.ACBDE 2.ADCBE 3.BDACE 4.CBAED 5.DACBE (…….)

| | X | Y |
|---|---|---|
| 20) | 1.භාගදූග | A රජුගේ උපදේශක |
| | 2.සේනානි | B රථාචාර්ය |
| | 3.පුරෝහිත | C බදු එකතු කරන්නා |
| | 4.සංග්‍රහිත්‍රී | D භාණ්ඩාගාරික |
| | 5.සූත | E සේනාපති |

1.BDCEA 2. CEADB 3.CEDBA 4.DCEAB 5.EABDC (…….)

අංක 21 - 25 තෙක් නිවැරදි පිළිතුර තෝරා එහි අංකය තිත් ඉරි මත ලියන්න.

21) මහා නාන තටාකයේ නටඹුන් හමුවන්නේ ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ කුමන නගරයේද?
1.හරප්පා 2..මොහෙන්ජොදාරෝ 3.චන්හුදාරෝ 4. කලිබංගන් 5.ලෝතාල් (......)

22) රාජතරංගනි නම් ග්‍රන්ථයේ කර්තෘවරයා කවරෙක්ද?
1.කාලිදාස 2..විශාකදත්ත 3.බිල්හන 4.බානභට්ට 5. කල්හන (......)

23) ඉන්දියාවට පැමිණීමට ආර්යයන් භාවිතා කළ මාර්ගය වුයේ,
1.මක්‍රාන් 2..ඛයිබර් 3.බෝලාන් 4. බැරෝඩා 5.සාල්පාට් (.......)

24) උතුරු ඉන්දියාව හා දකුණු ඉන්දියාව වෙන්කරනු ලබන සීමාව ලෙස සැලකෙන්නේ,
1.හිමාලය 2.සත්පුර 3.ආරවල්ලි 4.වින්ධ්‍යා 5.සුලෙයිමාන් (.......)

25) සොලොස්මහා ජනපද අතුරින් දකුණු ඉන්දියාවේ පිහිටි ජනපදය වන්නේ,
1.කාම්භෝජ 2.ගාන්ධාර 3.අංග 4.අස්මක 5.වත්ස (.......)

අංක 26 - 30 දක්වා මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් දක්වා ඇත.එම කරුණු අතුරින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ.එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉරි මත ලියන්න.

26) වයඹ දිග ඉන්දීය දූර්ග මාර්ග
1.අශෝක පළමුව මෙම ප්‍රදේශය ආක්‍රමණය කොට බලය තහවුරු කිරිම.
2.ආර්යයන් මෙම මාර්ග මඟින් පැමිණීම.
3.ඇලෙක්සැන්ඩර් මෙම මාර්ග හරහා ආක්‍රමණය කිරීම.
4. ශක ගෝත්‍රිකයන් පැමිණීම.
5.කුෂාණවරු පැමිණීම. (.......)

27) ගංගා යමුනා තැනිතලාවේ බලපෑම
1.මෙහි අගය වටහාගත් පළමුවන රජු අශෝකය.
2.සාරවත් පස සෞභාග්‍යයට මුල්විය.
3.මහා අධිරාජ්‍යය බිහි විය.
4.ඛනිජ සම්පත් බහුලව තිබීම.
5.කලා ගෘහ නිර්මාණ ශිල්ප හා සාහිත්‍ය වර්ධනය. (.......)

28) ඍග් වෛදික යුගයේ කාන්තාව,
1.සැමියා සමඟ හිමිදිරියේ දෙවියන් වැදීම.
2.ආගමික නිදහසක් නොලැබීම.
3.අධ්‍යාපනය ලැබීමට අවස්ථාව ලැබීම.
4.ඍෂි තත්වයට පත් කාන්තාවන් සිටීම.
5.ප්‍රසිද්ධ උත්සව වලට සහභාගි වීමට හැකිවීම. (.......)

29) ක්‍රි.පූ. හයවන සියවසේ රාජාණ්ඩු,
1.අංග ජනපදය උදේන රජු පාලනය කිරිම.
2.රාජාණ්ඩු දාහතරක් තිබීම.
3.මගධය ප්‍රභල රාජාණ්ඩුවක් වීම.
4.අවන්තිය බලවත් රාජ්‍යයක් වීම.
5.කෝසල රාජ්‍යයේ කොසොල් රජු යටතේ පාලනය වීම. (......)

30) පශ්චාත් වෛදික යුගයේ ආගම
1.බ්‍රහ්මන් සංකල්පය බලවත් වීම.
2.බමුණා භූසුර නමින් හැඳින්වීම.
3.ගෘහ යාග 40 ක් පැවැත්වීම.
4.කාන්තාවට ආගමික නිදහස ලැබීම.
5.මහා බ්‍රහ්මයා ලෝකය නිර්මාණය කිරීම. (.......)

අංක 31 - 35 දක්වා එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති යන ප්‍රතිචාර හතර අතුරින් එකක් හෝ කිහිපයක් නිවැරදිය.එම ප්‍රතිචාරය තෝරා,

AහාB නිවැරදි නම් අංක 01 ද
BහාC නිවැරදි නම් අංක 02 ද
BහාD නිවැරදි නම් අංක 03 ද
AහාC නිවැරදි නම් අංක 04 ද
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වඩා වැඩි නම් අංක 05 ද වරහන තුළ ලියන්න

31) මහාභාරතය

A මහාභාරතය සංස්කෘත භාෂාවෙන් ලියන ලද පැරණිතම මහාකාව්‍යවලින් එකකි.

B කෞරවයන් හා පාණ්ඩවයන් අතර පැවති දීර්ඝකාලීන ගැටුම මහාභාරතයට පාදක වී ඇත.

C ව්‍යාස ඍෂිවරයා මහාභාරතයේ කර්තෘ ලෙස විශ්වාස කරනු ලැබේ.

D කුරුක්ෂේත්‍රයේ සිදු වූ සුප්‍රසිද්ධාවසන් සටනින් යුධිෂ්ඨිර ජයග්‍රහණය කරන ලදී. (……)

32) භූගෝලීය සාධක

A උතුරේ ඇති කඳු පන්තිය වැදගත් වන්නේ එය ප්‍රධාන ගංගා දෙකක ප්‍රභවයට මුල්වී ඇති බැවිනි.

B ගංගා - යමුනා නිම්න අධිරාජ්‍ය කේන්ද්‍රස්ථානයක් විය.

C වයඹ දිග ඉන්දියාවේ ඇති කපොලු අතුරෙන් ඉන්දියාවට ඇතුළුවීමට වඩාත් පහසු කපොල්ලක් වන්නේ මක්‍රාන් කපොල්ලයි.

D ආරවල්ලි කඳු උතුරු හා දකුණු ඉන්දියානු දේශ සීමාව විය. (…….)

33) බිම්බිසාර රජු

A බුදුරජාණන් වහන්සේ ජීවත් වූ අවධියේ දී මගධය පාලනය කළේ බිම්බිසාර රජුය.

B බිම්බිසාර රජුගේ අගනුවර පාටලීපුත්‍රය විය.

C බිම්බිසාර රජු විවාහ සම්බන්ධතා සහ යුදමය ක්‍රියාමාර්ග මගින් තම බලය ව්‍යාප්ත කළේය.

D කාසි ජනපදයේ අයිතිය උදෙසා පසේනදි සහ බිම්බිසාර රජවරු අතර යුද්ධයක් සිදු විය. (……)

34) තක්ෂිලා

A තක්ෂිලාව ගාන්ධාරයේ අගනුවරයි.

Bතක්ෂිලාව සුප්‍රසිද්ධ අධ්‍යාපන මධ්‍යස්ථානයකි.

C තක්ෂිලා පාලක ආම්භි රජු විසින් මහා ඇලෙක්සැන්ඩර් පිළිගෙන ඔහුට තම හේවායන්ගේ සේවය ලබා දෙන ලදී.

D තක්ෂිලාහි උපරාජ වූ අශෝක උජ්ජේනි වෙත යවන ලද්දේ සුසීමගේ කැරලි මර්දනය කිරීම සඳහාය. (…….)

35) පාහියන් හිමි

A පාහියන් හිමි ඉන්දියාවට ඇතුළු වූයේ ටිබෙටය හරහාය.

B පාහියන් හිමි ඉන්දියාවට පැමිණියේ බෞද්ධ ග්‍රන්ථ ලබා ගැනීමේ සහ බෞද්ධ සිද්ධස්ථාන වැඳ පුදා ගැනීමේ පරමාර්ථයෙනි.

C චීනයට යාමට පෙර පාහියන් හිමි ශ්‍රී ලංකාවට පැමිණියේය.

D පාහියන් හිමි කනෞජ සම්මේලන පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් සපයා ඇත. (……)

අංක 36 - 40 දක්වා ප්‍රශ්න වලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත.එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවේ දක්වෙන 1,2,3,4,5 යන ප්‍රකාශ අතරින් කවර ප්‍රකාශ යුගලයකටදැයි තෝරා ඊට අදාළ අංකය වරහන් තුළ ලියන්න.

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදිය | වැරදිය |
| 2 | නිවැරදිය | නිවැරදිය |
| 3 | වැරදිය | වැරදිය |
| 4 | වැරදිය | නිවැරදිය |
| 5 | නිවැරදිය | නිවැරදිවන අතර පළමුවැන්න මැනවින් පහදයි |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36) | ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ක්‍රි.පූ.හතර වන සහශ්‍රයේ සිටම පැවතියේය. | මෙම ශිෂ්ටාචාරයට අයත් ගොඩනැගිලි ඉදිකොට ඇත්තේ ගඩොලිනි. (……) |
| 37) | කුරු - පාණ්ඩවයන් අතර සිදු වූ යුද්ධය මහාභාරතයෙන් විස්තර කෙරේ. | එම සටන සිදු වී ඇත්තේ කුරුක්ෂේත්‍රයේය.(……) |
| 38) | වර්ධමාන මහාවීර ජෛනයන්ගේ පළමුවන තීර්ථන්කරය. | මහාවීර කර්මය විශ්වාස නොකළේය. (…….) |
| 39) | ඍග් වේදයේ දැක්වෙන ස්ථාන නාම අනුව එවකට ජනාවාස පිහිටා තිබුණේ කුරුක්ෂේත්‍රය අවට ප්‍රදේශයේ බව පෙනේ. | පශ්චාත් වෛදික සමයේ දී සංස්කෘතික මධ්‍යස්ථානය බවට පත්වූයේ යමුනා සහ ගංගා නදීවලින් පෝෂණය වූ මධ්‍ය දේශයයි. (…….) |
| 40) | ක්‍රි.පූ.6 වන සියවසේ පැවති මහා ජනපද 16 පිළිබඳව අංගුත්තර නිකාය තොරතුරු ලබා දෙයි. | ජනපද 16 අතුරෙන් කිහිපයක් රාජාණ්ඩු වශයෙන්ද සෙසු ඒවා ගණ රාජ්‍ය වශයෙන්ද පැවතුණි.ප්‍රබල රාජාණ්ඩු වූයේ වත්ස,අවන්ති,කෝසල හා මගධයයි. (…….) |

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය Grade | 13 | විෂයය Subject | ඉන්දිය ඉතිහාසය - 11 |

නම/NAME:-.............................................................................................

සැලකිය යුතුයි.

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රය වශයෙන් කොටස් තුනකි.යටත් පිරිසෙයින් එක් කොටසකින් එක් ප්‍රශ්නයක් තෝරාගත යුතුය..

---

A කොටස

1) ඔබට සපයා ඇති ඉන්දිය සිතියමෙහි පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කර නම් කරන්න.
   1.තක්ෂිලා 2.සුලෙයිමාන් 3. මධුරෙයි 4.බැරෝඩා කපොල්ල
   5. හරප්පා 6. කාංචිපුරම් 7.තාමුලිප්ති 8. සත්ලෙජ්
   9. ථාර්කාන්තාරය 10. යමුනා නදිය 11. කාලිංග 12. තානේශ්වර්.(ලකුණු 12 )

B කොටස

2) "ඉන්දු නිම්න ශිෂ්ටාචාරය නාගරික ශිෂ්ටාචාරයකි"
   1.මෙම ශිෂ්ටාචාරයෙහි ප්‍රධාන නගර දෙකක් නම් කරන්න.(ලකුණු 02 )
   11.මෙම ශිෂ්ටාචාරයෙහි ප්‍රධාන වරාය දෙකක් නම් කරන්න.(ලකුණු 02)
   111.මෙම ශිෂ්ටාචාරයෙහි නගර සැලසුම් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.(ලකුණු 04)
   1V."ඉන්දු නිම්න ශිෂ්ටාචාරය යනු නාගරික ශිෂ්ටාචාරයකැයි " යන ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේදැයි හේතු දක්වන්න.(ලකුණු 08)
3) පශ්චාත් වෛදික යුගයේ ආගමික හා දේශපාලන තත්වයන්හි ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න .(ලකුණු 16 )
4) "මෞර්ය අධිරාජ්‍යය වනාහි පූර්වගාමික රාජවංශ කිහිපයක් විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති ගණනාවක ප්‍රතිඵලයකි",
   1.මගධය කේන්ද්‍රකරගෙන රාජ්‍යයක් ආරම්භ කළ මුල්ම පාලකයා නම් කරන්න.(ලකුණු 01 )
   11.මෞර්යයන්ට පෙර මගධය පාලනය කළ රාජවංශ දෙකක් නම් කරන්න.(ලකුණු 02)
   111.මෞර්යයන්ට පෙර සිටි රාජවංශ විසින් අධිරාජ්‍යයකට අවශ්‍ය පදනම දමන ලද ආකාරය පරීක්ෂා කරන්න.(ලකුණු 05)
   1V. මගධය කේන්ද්‍ර කරගත් අධිරාජ්‍යයක් ව්‍යාප්ත කිරීමෙහිලා මෞර්ය රජවරුන් විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග පරීක්ෂා කරන්න.(ලකුණු 08)
5) පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   1.වෛදික යුගයේ සමාජය
   11.ක්‍රි.පූ.හයවන සියවසෙහි ගණ රාජ්‍ය
   111.මෙගස්තිනිස්
   1V.අර්ථශාස්ත්‍රය (ලකුණු 8 x 2)

C කොටස

6) මෞර්ය අධිරාජ්‍යය බිඳ වැටීමෙන් පසුව වයඹදිග ඉන්දියාවේ විදේශ ආධිපත්‍යය පිහිටුවීම පිළිබඳව විස්තර කරන්න.(ලකුණු 16)

7) 1.හර්ෂවර්ධන රජුගේ රාජධානියේ අගනුවර නම් කරන්න.(ලකුණු 01 )
11."හර්ෂචරිත" නමැති කෘතියේ කතුවරයා නම් කරන්න.(ලකුණු 01)
111.හර්ෂවර්ධන රජු විසින් රචනා කරන ලද ග්‍රන්ථ දෙකක් නම් කරන්න.(ලකුණු 02 )
1V.හර්ෂවර්ධන රජුගේ දේශපාලන,සංස්කෘතික හා ආගමික කාර්ය සංසිද්ධීන් සාකච්ඡා කරන්න(ලකුණු 12 )

8) පහත දැක්වෙන මාතෘකාවලින් 2 ක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.
1.පශ්චාත් වෛදික යුගයේ දේශපාලන තත්වය.
11. අලහාබාද් ප්‍රශස්තිය.
111කුෂාණ සමයේ බුදුදහම
1V. දෙවන චන්ද්‍රගුප්ත යටතේ ගුප්ත අධිරාජ්‍යයේ ව්‍යාප්තිය.. (ලකුණු 8 x 2)

9) "ගුප්ත යුගය යනු ඉන්දියානු සංස්කෘතියේ ස්වර්ණමය යුගයයි" විමසන්න.(ලකුණු 16)

